බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>My Number | USJP/EEX-06/2024 | ලිපිනය<br>Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල<br>Post Box 10, Gangodawila<br>නුගේගොඩ, ශ්‍රී ලංකා<br>Nugegoda, Sri Lanka , |
| ඔබේ අංකය<br>Your Number | | | |
| දුරකථනය<br>Telephone | 011-2801481, 011-3132496 | වෙබ් අඩවිය<br>Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස්<br>Fax | 011-2802753 | විද්‍යුත් තැපැල<br>E-mail | info.ext@sjp.ac.lk |


2024.09.25

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි,

## විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි II කොටස පරීක්ෂණය (නව විෂය නිර්දේශය) සඳහා අයදුම්පත් කැඳවීම - 2024

01. 2022 අධ්‍යයන වර්ෂයට අදාල සිසුන් පමණක් ඉහත පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට සහ පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන්න

| | |
|---|---|
| පරීක්ෂණ අයදුම්පත සහ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය | www.external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය “v” අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කරගත හැක. |
| **පරීක්ෂණ ගාස්තු** | **රු.12,000.00** |
| අයදුම්පත් යොමුකළ යුතු ලිපිනය | ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. |
| **අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය** | **2024/10/22** |

02. සැලකිය යුතුයි

I. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පරීක්ෂණ ගාස්තු ගෙවීමෙන් අනතුරුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ප්‍රථම ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම සඳහන් කළ යුතුවේ.

II. **උපාධි II පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර පාඨමාලා ගාස්තු දෙවන හා තෙවන වාරික ගෙවීම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

III. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2024.10.22 වන අතර එම දිනයෙන් පසුව කිසිඳු හේතුවක් මත අයදුම්පත් භාර ගනු නොලැබේ.

IV. පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. (එහි ඡායා පිටපතක් ළඟ තබාගත යුතු අතර වෙනත් ගිණුම් අංක වලට ගෙවන ලද මුදල් පිලිබඳව විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ.)

V. නියමිත පරිදි මුදල් නොගෙවන ලද, අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VI. පරීක්ෂණයට අදාළ කාල සටහන www.external.sjp.ac.lk යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියළු දැනුවත් කිරීම් වෙබ් අඩවිය හරහා පමණක් සිදුකරන බැවින් නිරතුරුවම වෙබ් අඩවිය පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය වේ.

VII. විදේශ ගත සිසුන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ EDECU online Distance Supervision Exam පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක.ඒ සඳහා වන විස්තර http://external.sjp.ac.lk/online-examinations-for-migrated-students/ යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

VIII. **නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍ර www.external.sjp.ac.lk/Management (Public) General (External) Degree/Examinations/Admission Card වෙත පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය V අක්ෂරය රහිතව ඇතුලත් කිරීමෙන් ලබාගත හැකි අතර විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.**

**උපාධියක් සම්පූර්ණ කිරීම : උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන්**

උපාධියක් ලැබීමට, සිසුවෙකු විසින් පහත කරුණු සපුරාලිය යුතු වේ:

- සම්භාර පැය 90ක් සම්පූර්ණ කර තිබීම, සහ
- එක් එක් අධ්‍යයන වර්ෂයක් සඳහා අවම වශයෙන් 2.00ට නොඅඩු **GPA** මට්ටමක් ලබා තිබීම, සහ
- සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා 2.00ක අවම සමස්ත **GPA** මට්ටමක් ලබා තිබීම, සහ
- අසමත් ශ්‍රේණි (**'D'**හෝ **'E'**) නොතිබීම, සහ
- එක් අධ්‍යයන වර්ෂයක් සඳහා දුර්වල ශ්‍රේණි (**'C-'**හෝ **'D+'**) එකකට නොවැඩිවීම, සහ
- සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා වන දුර්වල ශ්‍රේණි (**'C-'**හෝ **'D+'**) සංඛ්‍යාව 03 නොඉක්මවීම, සහ
- සම්භාර රහිත පාඨමාලාව සඳහා 'සමත්' (**'C'**ශ්‍රේණිය) ලබා තිබීම, සහ
- ප්‍රථමයෙන්ම විශ්වවිද්‍යාලයට බැඳුණු අධ්‍යයන වර්ෂයේ සිට උපරිම වශයෙන් වසර (07)ක් ඇතුලත ඉහත දක්වා ඇති සියලු අවශ්‍යතාවන් සපුරා තිබීම.

**<u>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ</u>**

**<u>292 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු</u>**

**<u>බාහිර අපේක්ෂකයන් සදහා</u>**

7.4 අසනීප නිසා මුළු විභාගයටම හෝ විභාගයේ කොටසකට පෙනී නොසිටි / නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් ඒ බව විභාග ආරම්භ විමට ප්‍රථම හෝ විභාග පැවැත්වෙන කාල සීමාව තුළ හෝ රජයේ ආරෝග්‍ය ශාලාවකින් වෛද්‍ය සහතිකයක් නියෝජ්‍ය ලේඛකාධිකාරී හෝ සහකාර ලේඛකාධිකාරී / බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය.

7.5 නොවැලැක්විය හැකි හේතුවක් මත ඒසේ කිරිමට අපොහොසත් වන අපේක්ෂකයින් තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් අදාල විභාගය හෝ විභාගයේ කොටස පැවැත්විමට නියමිත දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය. පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන බටහිර ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික පිළිගනු නොලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2024.09.25